## IV. කාර්ය මණ්ඩල ප්‍රවෘත්ති

අග්නිදිග ආසියාතික මහ බැංකු අධිපතිවරුන්ගේ නවවැනි සම්මේලනයට සහභාගිවීම සඳහා අධිපති එච්. ඊ. තෙන්නකෝන් මහතා 1974 මාර්තු 1 වැනි දින නේපාලය බලා පිටත්ව ගොස්, 1974 මාර්තු 12 වැනි දින ආපසු පැමිණියේය.

ආසියානු එළදයිතා සංවිධානයේ අධිකාරී මණ්ඩලයේ දහසය වැනි සැසිවාරයට සහභාගී වීම සඳහා 1974 අප්‍රියෙල් 14 වැනි දින සිංගප්පූරුවට පිටත්ව ගිය අධිපති, 1974 අප්‍රියෙල් 21 වැනි දින ආපසු පැමිණියේය.

ජාත්‍යන්තර නිරවුල් කිරීමේ බැංකුවේ වාර්ෂික මහ සභාවට සහභාගී වීම පිණිස 1974 ජූනි 5 වැනි දින බාල්වලට පිටත්ව ගිය අධිපති, 1974 ජූනි 30 වැනි දින ආපසු පැමිණියේය.

වොෂින්ටනයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවේ වාර්ෂික රැස්වීම්වලට සහභාගි වීම් වස්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාව වෙනුවෙන් විකල්ප අධිපති වන මහ බැංකුවේ අධිපති, වොෂිංටන් නුවරදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුවේ ශ්‍රී ලංකාව වෙනුවෙන් අධිපති වන මුදල් ඇමැති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ආචාර්ය එන්. එම්. පෙරේරා සමඟ එක් විය. හේ ලංඩනයේ සහ නිව්යෝර්ක් වලදී නිල සාකච්ඡා පැවැත්විය. 1974 සැප්තැම්බර් 14 වැනි දින ලංකාවෙන් පිටත්ව ගිය හේ 1974 ඔක්තෝබර් 15 වැනි දින ආපසු පැමිණියේය.

බැංකොක් හි ආසියානු තුලන සංගමයේ ප්‍රාරම්භක රැස්වීමට සහභාගි වීම සඳහා 1974 දෙසැම්බර් 8 වැනි දින ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය අධිපති, ඉන්පසුව නිල කටයුතු සඳහා ටෙහෙරාන් වලට ගොස් 1974 දෙසැම්බර් 17 වැනි දින ආපසු පැමිණියේය.

මුදල් අමාත්‍යාංශයේ ලේකම් සී. ඒ. කුරේ මහතා, වොෂිංටනයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබඳ බැංකුවේ වාර්ෂික රැස්වීම් වලට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටියේය. ඔහු දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ, මුදල් අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් එල්. බී. අබේරත්න මහතා මුදල් මණ්ඩලයේ නිල සාමාජිකවරයා වශයෙන් ක්‍රියා කළේය.

1974 ඔක්තෝබර් සිට ක්‍රියාත්මක බවට පත්වූ, 1974 අංක 37 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත) 8 (2) (සී) වගන්තියෙන්, ක්‍රමසම්පාදනය සහ ආර්ථික කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් දනට නිල දරණ පුද්ගලයා මුදල් මණ්ඩලයේ සාමාජිකයෙක් ද වෙයි. ක්‍රමසම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, ආචාර්ය එච්. ඒ. ද එස්. ගුණසේකර ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි 1974 ඔක්තෝබර් 31 වැනි දින, ආචාර්ය ගුණසේකර වෙනුවෙන් වැඩ බැලීමට පත්කර සිටි ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ආචාර්ය එස්. ඒ. මීගම මුදල් මණ්ඩලයේ එදින රැස්වීමට සහභාගී විය.

නියෝජ්‍ය අධිපති ආචාර්ය ගාමණී කොරයා. 1974 අප්‍රියෙල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ ලේකම් ජෙනරාල් වශයෙන් නිල කටයුතු භාර ගත්තේය.

නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තවදුරටත් නිරත විය.

1974 මාර්තු 2 වැනි දින සිට 1974 මාර්තු 14 වැනි දින දක්වාත්, 1974 අප්‍රියෙල් 14 වැනි දින සිට 1974 අප්‍රියෙල් 22 වැනි දින දක්වාත් 1974 ජුනි 5 වැනි දින සිට 1974 ජුලි 1 වැනි දින දක්වාත්, 1974 සැප්තැම්බර් 14 වැනි දින සිට 1974 ඔක්තෝබර් 15 වැනි දින දක්වාත්, 1974 දෙසැම්බර් 8 වැනි දින සිට 1974 දෙසැම්බර් 17 වැනි දින දක්වාත් අධිපති දිවයිනෙන් බැහැරව සිටි කාලච්ඡේදය තුළ, මුදල් නීති පනතේ 24 වැනි වගන්තියේ ප්‍රකාර, නියෝජ්‍ය අධිපති පී. වී. එම්. ප්‍රනාන්දු මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ලෙස නම් කරනු ලැබ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය.

1974 ජනවාරි 4 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම් අධිපතිගේ සහකාර වශයෙන් පත් කරනු ලැබීය.

රාජ්‍ය පරිපාලන, පළාත්පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට මුදහරිනු ලැබ සිටි පී. එච්. සිරිවර්ධන මහතා 1974 මාර්තු 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු සේවාවෙන් ඉල්ලා අස්වූයේය.

බැංකු පරිපාලන අධ්‍යක්ෂ ජේ. ජී. පී. ජයසුන්දර මහතා 1974 නොවැම්බර් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලැබීය.

අභ්‍යන්තර විගණක එම්. පී. පෙරේරා මහතා 1974 ඔක්තෝබර් 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු සේවයෙන් විශ්‍රාම ගියේය.

අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ, ආචාර්ය එච්. එන්. එස්. කරුණාතිලක 1974 ජනවාරි 4 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත්කරනු ලැබීය.

බැංකු පරිපාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, වී. සච්චිතානන්දන් මහතා 1974 ජනවාරි 4 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු ලැබීය. 1974 නොවැම්බර් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි හේ වැඩ බලන අභ්‍යන්තර විගණක ලෙස පත්කරන ලදී.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විනිමය පාලක, ඒ. ඩී. මෝර්ටිමර් මහතා 1974 ජනවාරි 12 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වැඩ බලන අතිරේක විනිමය පාලක වශයෙන් පත්කරනු ලැබීය. ඔහුගේ නිල කටයුතුවලට අතිරේකව, අභ්‍යන්තර විගණක එම්. පී. පෙරේරා මහතා 1974 ඔක්තෝබර් 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගැනීමේදී 1974 නොවැම්බර් 1 වැනි දින සිට වැඩ බලන අභ්‍යන්තර විගණක වශයෙන් වී. සච්චිතානන්දන් මහතා පත්කරන තෙක් අභ්‍යන්තර විගණක දෙපාර්තමේන්තුවේ කටයුතු බලාගැනීමට පත්කරනු ලැබූයේය.

විශේෂ නිලධාරි ඩී. එල්. කන්නන්ගර මහතා 1974 ජනවාරි 4 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු පරිපාලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කළේය. 1974 නොවැම්බර් 1 වැනි දින සිට වැඩ බලන බැංකු පරිපාලන අධ්‍යක්ෂ වශයෙන් ඔහු පත්කරනු ලැබීය.

මුදල් අමාත්‍යාංශයේ නිරතව සිටි එච්. ආර්. ද සොයිසා මහතා 1974 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි තුන් අවුරුදු කාලයකට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සේවය සඳහා මුදා හරින ලදී.

ඒ. එස්. ජයවර්ධන මහතා 1974 ජුලි 10 වැනි දින තෙක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සාමාජිකයෙකු ලෙස තව දුරටත් කටයුතු කළේය.

ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු 1974 ජනවාරි 1 වැනි දින තෙක් ඒජන්සි ආයතන හා තැරැව්කාර සමාගම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස තවදුරටත් කටයුතු කළේය.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සේවයේ නිරතව සිටි ආචාර්ය ජී. උස්වත්තආරච්චි 1974 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු සේවයෙන් ඉල්ලා අස් විය.

ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට මුදහැර සිටි ආචාර්ය එස්. එම්. පී සූරියාරච්චි 1974 ජනවාරි 1 වැනි දින සිට යළි බැංකු සේවයට පැමිණියේය. 1974 දෙසැම්බර් 31 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි හේ බැංකු සේවයෙන් ඉල්ලා අස්වූයේය.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට මුද හැර සිටි ආචාර්ය ආර්. සී. වනිගතුංග 1974 අප්‍රේල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි යළි බැංකු සේවයට පැමිණියේය.

ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට මුද හරිනු ලැබ සිටි පී. එම්. හසන් මහතා 1974 සැප්තැම්බර් 8 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකු සේවයට යළි පැමිණියේය. ඉන්පසුව 1974 ඔක්තෝබර් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි විදේශීය සහ දේශීය වෙළෙඳ අමාත්‍යාංශයේ සේවය සඳහා ඔහු මුද හරිනු ලැබීය.

විමර්ශනයට ලක් වූ වර්ෂය තුළදී පහත දක්වෙන මහ බැංකු නිලධාරීන් රජයේ සහ රාජ්‍ය සංස්ථාවල තවදුරටත් සේවය කිරීම සඳහා පූර්ණ කාලීන වශයෙන් මුදහරිනු ලැබ සිටියහ.

| | |
|---|---|
| නාවුක හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | - පී. බී. කරඳවෙල මහතා |
| රාජ්‍ය මැණික් සංස්ථාව | - ටී. ජී. පුංචිඅප්පුහාමි මහතා |
| ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | - ආචාර්ය එම්. ජේ. ප්‍රනාන්දු |
| මුදල් අමාත්‍යාංශය | - එච්. එම්. ආර්. ඇල්ලෙපොල මහතා |